# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1311/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 13/08/2024 පැය 1045

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.08.12 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 40 | - | ප්ලාස්ටික් කෑන් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.**

2024.08.12 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කොටුවිල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 800 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කොටුවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් රාගම පොලිස් වසමේ බටුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 09 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන බටුවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.12 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් රාගම පොලිස් වසමේ බටුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 200 ක් සමඟ යතුරුපැදියකින් ප්‍රවාහනය

කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. ගංජා හේනක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.08.11 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් විසින් හම්බේගමුව පොලිස් වසමේ ඉදිගහපැලැස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර ගංජා ගස් 40,000 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 37 හා 44 වයස් වල පසුවන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. ගංජා හේනක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.08.11 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් විසින් හම්බේගමුව පොලිස් වසමේ ඉදිගහපැලැස්ස ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර ගංජා ගස් 18,000 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.** හම්බේගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**